සියලු ම හිමිකම් ඇවිරිණි முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | ගෘහ ආර්ථික විද්‍යාව I පත්‍රය<br>மனைப்பொருளியல வினாத்தாள்-1<br>**Home Economics Paper I** | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |

<u>සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.</u>

<u>අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.</u>

1 ජීවන චක්‍රයේ විශේෂිත පෝෂණ අවශ්‍යතා ඇති අවධිය ලෙස හඳුන්වන්නේ,

1 ළදරු අවධිය, ළමා අවධිය, හා ක්ෂීරණ අවධිය යි.

2 ළදරු අවධිය, යොවුන් අවධිය හා ගර්භණී අවධිය යි.

3 යොවුන් අවධිය, වැඩිහිටි අවධිය, හා ක්ෂීරණ අවධිය යි.

4 යොවුන් අවධිය, මහලු අවධිය, හා ක්ෂීරණ අවධිය යි.

2 මස් වල අඩංගු ප්‍රෝටීන් හඳුන්වන්නේ ,

1 ලෙගියුමින් ලෙස ය. 2 ඇල්බියුමින් ලෙස ය.
3 කේසීන්ලෙස ය. 4 මයොසින් ලෙස ය.

3 යකඩ ඌණතාවය නිසා සෑදෙන රෝගයකි,

1 අධික රුධිර වහනය ඇතිවීම. 2 නීරක්තිය. 3 අස්ථි විකෘති වීම. 4 මස් පිඩු පෙරළීම.

4 කාබෝහයිඩ්‍රේට් වල සරලම තත්ත්වය වනුයේ,

1 ග්ලූකෝස් ය. 2 පෙක්ටෝස් ය. 3 ඇමයිනෝ අම්ල ය. 4 ග්ලැක්ටෝස් ය.

5 සංතෘප්ත මේද අම්ල වර්ගයකි,

1 මිරිස්ටික් අම්ලය. 2 ඔලෙයික් අම්ලය.

3 ලිනොලෙයික් අම්ලය. 4 ඇරකිඩොනික් අම්ලය.

6 අලුත් මාළු හඳුනා ගත හැකි ක්‍රමයකි,

1 කරමල රතු පැහැ වීම. 2 දුර්ගන්ධයෙන් යුක්ත වීම.

3 කොරපොතු මඳ වශයෙන් තිබීම. 4 මාළුවා මෘදු වයනයෙන් යුක්ත වීම.

17 පූර්ව ප්‍රසව සංවර්ධනයේදී එක් අවධියක් වනුයේ,

1 පරිණත ඩිම්බ අවස්ථාව    2 සෛල අවස්ථාව

3 ආර්ථව අවස්ථාව    4 කලල අවස්ථාව

18 සංසේචිත ඩිම්බය හඳුන්වනුයේ,

(1) ශුක්‍රාණුවක් ලෙස ය.    (2) ඩිම්බයක් ලෙස ය.

(3) යුක්තානුවක් ලෙස ය.    (4) පරිණත ඩිම්බයක් ලෙස ය.

19 ගර්භණී මවක් මාතෘ සායනයේ දී භාජනය නොවන පරීක්ෂණයකි,

(1) මුත්‍රා පරීක්ෂණය    (2) ග්ලූකෝස් පරීක්ෂණය

(3) උස බර බැලීම    (4) මානසික සුවය

20 ආර්ථව චක්‍රය නැවතීම,

(1) අධිරෝපණය යි.    (2) ආරථව හරණය යි.

(3) විසරණය යි.    (4) සංසේචනය යි.

21 ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා උපාංග ඉතා ප්‍රයෝජනවත් වේ.උපාංගයක් මැසීම සඳහා යොදා ගත හැකි විසිතුරු මැහුම් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

1 වාටි මැස්ම,දම්වැල් මැස්ම,පිස්මේන්තු මැස්ම, පයිපින් කිරීම.

2 දම්වැල් මැස්ම,බ්ලැන්කට් මැස්ම,කතිර මැස්ම,නැටි මැස්ම.

3 පිස්මේන්තු මැස්ම,බයින්ඩින් කිරීම,සන්නාලි මැස්මනැටි මැස්ම.

4 සිප්පි වාටිය,සෙටින් මැස්ම,රේන්ද ඇල්ලීම,වාටි මැස්ම.


22 උපාංගයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන මෙවලමකි,

1 ස්ත්‍රික්කය    2 වෙල්කෝර් ටේප්    3 බොත්තම්    4දැති රෝදය

23 මූලික මැහුම් ක්‍රමයක් වුවත් රෙදිපිළි අළුත් වැඩියාවේ දී මෙන්ම විසිතුරු කිරීමේදී ද යොදා ගන්නා මැහුම් ක්‍රමයකි,

1 දම්වැල් මැස්ම    2 සන්නාලි මැස්ම    3 පිස්මේන්තු මැස්ම    4සිහින් නූල් දුවවීම

24 මෙම රූපයෙන් පෙන්වන මැහුම් ක්‍රමය වන්නේ,



1 සන්නාලි වාටි මැස්ම    2 සැඟි වාටි මැස්

3 වාටි මැස්ම    4 පිස්මේන්තු මැස්ම

25 නිර්මාණයක සෘජු හා වක්‍ර දාර (අද්දර) නිම කිරීමට යොදා ගත හැකි මැහුම් ක්‍රම ඇතුළත් පිළිතුර වන්නේ,

1 පයිපින් කිරීම,රේන්ද ඇල්ලීම,බඳන යෙදීම ය.

2 පයිපින් කිරීම,බ්ලැන්කට් මැස්ම,කතිර මැස්ම ය.

3 පයිපින් කිරීම,බඳන යෙදීම,දම්වැල් මැස්ම ය.

4 පයිපන් කිරීම,රේන්ද ඇල්ලීම,වාට් යෙදීම ය.

26 කෙඳි වර්ගීකරණයට අනුව අර්ධ කෘත්‍රිම කෙඳි වර්ගයකි,

1 රම්  2 සේද  3 විදුරු  4 රෙයෝන්

27 ළදරු ඇඳුමක තිබිය යුතු විශේෂ ලක්ෂණයක් නොවන්නේ,

1 ඇඳුම් ලිහිල් වීම ය.  2 මූට්ටු අවම වීම ය.

3 සැන ගාංචු භාවිතය ය.  4 සරල පන්නයක් වීම ය.

28 ළදරු ඇඳුම මැසීමේ අනුපිළිවෙළ ඇතුළත් පිළිතුර වන්නේ,

1 උරහිස් මැසීම, විවරය, ක්‍ර, අත්කට.වාටිය ය.2 උරහිස් මැසීම, කර, වාටිය,අත්කට,විවරයය

3 උරහිස් මැස්ම, වාටිය, කර, අත්කට, විවරය ය. 4 උරහිස් මැසීම, විවරය, වාටිය, අත්කට,කර

29 ගෘහීය උපාංගයක් වන කුෂන් කවරයක පියවීම සඳහා යොදා ගත හැකි මැහුම් ක්‍රම වනුයේ,

1බොත්තම් කාස මැස්ම,දෙපෙති ජන්තු,සැනගාංචු යෙදීම ය.

2 පයිපින් කිරීම,දෙපෙති ජන්තු, සැනගාංචු යෙදීම ය.

3 වෙල්කොර් ටේප් ඇල්ලීම, පයිපින් කිරීම, සැනගාංචු, වෙල්කොටේප් ඇල්ලීම ය.

4 දෙපෙති ජන්තු, සැනගාංචු,වෙල්කොටේප් ඇල්ලීම ය.

30 ළමා ඇඳුමක් නිර්මාණය කිරීමේ දී සැළකිලිමත් වියයුතු කරුණු වන්නේ,

1 ඇඟලෑම හා ගැලවීම පහසු වීම,උචිත පියවීම් ක්‍රම භාවිතය.

2 මූට්ටු අඩු වීම හා විසිතුරු කිරීම,අලංකාරබව.

3 ලිහිල් බව,හා මූට්ටු අඩු වීම.

4 ඇඟලෑමට හා ගැලවීමට පහසු වීම හා මූට්ටු අඩු වීම.

31 ළමා ඇඳුම මැසීමේ දී මිමි ගණනය කර ලබා ගත යුතු මිමි ඇතුළත් පිළිතුර වන්නේ,

1 ඉන,පපුව,අත පළල,ඉන සිට උරහිස දක්වා උස ය. 2 ඉන,පපුව,ආර අතර පළල, පළමු හරස් මිම්ම ය.

3 ඉන,පපුව,අත උස, දෙවන හරස් මිම්ම ය.  4 ඉන,පපුව,අතයට,ආර අතර පළල ය.

32 ළමා ඇඳුමේ කර නිම කිරීම සඳහා යොදා ගත හැකි මැහුම් ක්‍රමයකි,

1 බඳන වාටිය යෙදීම. 2 රළි පටි ඇල්ලීම. 3 රේන්ද ඇල්ලීම. 4 ඉදිකටු රේන්දය

33 විසිතුරු මැහුම් ක්‍රම කිහිපයකි,

1 බුලියන් මැස්ම,සැටින් මැස්ම, දිගෙකාට මැස්ම

2 බුලියන් මැස්ම, සැටින් මැස්ම, පිස්මේන්තු මැස්ම

3 බුලියන් මැස්ම, ප්‍රංශ ගැට මැස්ම, වාටි මැස්ම

4 දිගෙකාට මැස්ම,හුරුළු කටු මැස්ම,පිස්මේන්තු මැස්ම

34 විස්තීරණ පවුල හඳුන්වන තවත් නමකි,

1 සංයුක්ත පවුල 2 අණු පවුල 3 ඒකීය පවුල 4 සමීප පවුල

35 විවාහ වී දරුවන් ලැබීමෙන් පසු කාලය මේ නමින් හැඳින්වේ.

1 ආරම්භක අවධිය 2 සංකෝචන අවධිය 3 වර්ධක අවධිය 4සංවර්ධන අවධිය

36 පවුලක සාමාජිකෙයකුට පවුලෙන් ලැබෙන ආදරය,රැකවරණය,සහයෝගය අයත් වනුයේ,

1කායික අවශ්‍යතා වලට ය. 2 මානසික අවශ්‍යතා වලට ය.

3 භෞතික අවශ්‍යතා වලට ය. 4 සාමාජයීය අවශ්‍යතා වලට ය.

37 කුඩා නිවසකට වඩාත් යෝග්‍ය වන බහුකාර්ය ගෘහ භාණ්ඩයක් වනුයේ,

1තට්ටු ඇඳ 2 ලාච්චු සහිත ඇඳ 3 ඩිවානය 4 කණ්නාඩි මේසය

38 ගෘහීය සම්පත් අතර භෞතික සම්පත් ගණයට අයත් වේ,

1 මුදල්,ජලය,ඉඩකඩ,විදුලිය. 2 මුදල්,ජලය,ඉන්ධන,කාලය.

3 මුදල්,ජලය,ඉඩකඩ,ප්‍රජා පහසුකම්. 4 මුදල්,ජලය,ෙද්පල,විදුලිය.

39 නිවසකට ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබාගත හැකි ක්‍රමයක් වන්නේ,

1 වීදුරු ගෙඩාල් ය. 2 වහලේ උස වැඩි කිරීම ය.

3 දොර හා ජනෙල් ය. 4 වීදුරු උළු කැට යෙදීම ය.

40 පවුලට ලැබෙන ආදායම නිසි පරිදි කළමනාකරණයට,

1 ශ්‍රම විභජන සටහන වැදගත් ය. 2 අය-වැය ලේඛනය වැදගත් ය.

3 කාල සටහන වැදගත් ය. 4 සම්පත් වර්ගීකරණය වැදගත් ය.

## ගෘහ ආර්ථික විද්‍යාව - මධ්‍ය වාර පරීක්ෂණය -2016

### පිළිතුරු පත්‍රය 1 කොටස

බහුවරණ ප්‍රශ්න

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 3 | 21 - 2 | 31 - 4 |
| 2 - 4 | 12 - 1 | 22 - 4 | 32 - 1 |
| 3 - 2 | 13 - 2 | 23 - 4 | 33 - 1 |
| 4 - 1 | 14 - 2 | 24 - 1 | 34 - 1 |
| 5 - 1 | 15 - 3 | 25 - 1 | 35 - 2 |
| 6 - 1 | 16 - 2 | 26 - 4 | 36 - 2 |
| 7 - 3 | 17 - 4 | 27 - 3 | 37 - 2 |
| 8 - 2 | 18 - 3 | 28 - 1 | 38 - 3 |
| 9 - 4 | 19 - 4 | 29 - 1 | 39 - 3 |
| 10 -3 | 20 - 2 | 30 - 4 | 40 - 2 |

### 11 කොටස

1 ප්‍රශ්නය

1.1 හැඩය වෙනස් වීම, තැනින් තැන කළු පැහැ වීම, දියර පිතට ගලා යාම, අම්හිරි ගන්ධය, පණුවන් සිටීම.

1.2 10 ශ්‍රේණිය පෙළපොතෙහි පිටුව 100 (රූප සටහන)

1.3 කැවුම්, මුං කැවුම්, කොකිස්, මුං ගුලි, පැණි වළලු, ආස්මි

1.4 තිරිඟු වල අඩංගු ග්ලූටන්

1.5 බලැන්කට් මැස්ම, බදන යෙදීම, පයිපින් යෙදීම,රේන්ද යෙදීම, ඉදිකටු රේන්දය

1.6 සේදීමේ පහසුව, මනා ලෙස ජලය අවශෝෂණය, කල් පැවැත්ම, මැදීමේ දි ඉහළ උෂ්ණත්වය යොදා ගත හැකි වීම

1.7 පැරොටිඩ් ග්‍රන්ථි අධෝජිහ්ව ග්‍රන්ථිය උප ඌර්ධවහනුක ග්‍රන්ථිය

1.8 උණුසුම් වර්ණ - රතු, කහ, නිල්
සිසිල් වර්ණ - දම්, නිල්, කොළ

1.9 දරුවාව අගය කිරීම ආදරය, සෙනෙහස දැක්වීම පිළිගැනීම වගකීම් පැවරීම ඇහුම්කන් දීම නිදහස ලබා දීම

1.10 මැද මිදුල හා පොකුණු වහලට විනිවිද පෙනෙන ආවරණ තහඩු වීදුරු ගඩොල් වීදුරු උළු කැට වහලේ උස වැඩි කිරීම (ලකුණු 2×10=20)

2. 1 බිත්ති සැරසිල්ල, අත්පිස්නා රදවනය, ඩොයිලිය, පෞද්ගලික කවරය (ලකුණු 03)

2. 2 රේන්ද ඇල්ලීම, බදන යෙදීම, රළිපටි ඇල්ලීම, බ්‍රේඩින් පටි ඇල්ලීම (ලකුණු 01)

2.3 a)ඉදිකටු රේන්දය,සිප්පි වාටිය, බලැන්කට් මැස්ම, ඇඹරුම් වාටිය, බීක්කු මැස්ම (ලකුණු 02)

b) රූප සටහනට අනුව (ලකුණු 02)

3. 1 ලයිසින්, ලියුසින්,අයිසොලියුසින්,මෙතියොනින්,ෆීනයිල් ඇලනීන්, ත්‍රියොනින්,ට්‍රිප්ටොපෑන්, වැලීන්, හිස්ටිඩින්, ආර්ජිනීන් (ලකුණු 03)

3. 2 a) විටමින් C

b) පැගිරි පවුලට අයත් පළතුරු, කජු පුහුලන්, තක්කාලි, නෙල්ලි, පේර (ලකුණු 02)

3. 3 සෛල වල ස්ථායීතාව පවත්වා ගැනීම ආහාර ජීරණයට,අවශෝෂණයට, පරිවහනයට උපකාරී වීම, බහිස්‍රාවී ක්‍රියාවලිය පහසු වීම, සිරුරේ උෂ්ණත්වය පාලනය කිරීම, මළ බද්ධය වැළැක්වීම, රුධිරයේ සාන්ද්‍රනය පවත්වාගෙන යාමට (ලකුණු 04)

4. 1 මනා පෝෂණයක් ලබා ගැනීම සඳහාආහාර නිවැරදිව තෝරා ගැනීම
විවිධ ආහාර කාණ්ඩ වලින් ආහාර තෝරා ගැනීම
ආහාර වේලෙහි විවිධත්වය ඇති කිරීමට (ලකුණු 03)

4. 2 a) ඔමේගා 3 මේද අම්ලය (ලකුණු 01)
b) හෘදයාබාධ වළක්වා ගැනීමට
කලල අවධියේ දී කළලයේ මොළය වර්ධනය
රුධිරයේ ඝනත්වය අඩුවීම, කොළෙස්ටරෝල් නොමැති වීම (ලකුණු 02)

4. 3 a) විසරණය - වැඩි සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයක සිට අඩු සාන්ද්‍රණ මාධ්‍යයකට ද්‍රව්‍ය අංශු ගමන් කිරීමයි.

b) බාහිර ආස්‍රැතිය - වැඩි ජල අණු සාන්ද්‍රණයක සිට අඩු ජල අණු සාන්ද්‍රණයක් දක්වා අර්ධ පාරගම්‍ය පටලයක් හරහා ජල අණු ගමන් කිරීම වේ.මෙම ක්‍රියාවලිය සිදු වන්නේ ආහාරය තුළ සිට පිටතටය.
(ලකුණු 2 ×2 = 4 යි)

5. 1 නිවස තුළ තෙතමනය ඉවත් වීම,
ක්ෂුද්‍ර ජීවී වර්ධනය අවම කර ගත හැකි වීම,
නිවසේ විවිධ කාර්යයන් කිරීමේ දී ඉක්මනින් වෙහෙසට පත් නොවීම,
නිවසේ උණුසුම අඩු වීමෙන් සුව පහසුව ඇති වීම,
කෘත්‍රිම ආලෝකය හා වාතාශ්‍රය ලබා ගැනීමටඅවශ්‍ය නොවීම (ලකුණු 03)

5. 2 රාශීකරණය, බහුකාර්යය ඒකකය, බහුකාර්යය ගෘහ භාණ්ඩ,ඉඩකඩ පිරිමසන ගෘහ භාණ්ඩ (ලකුණු 03)

5. 3 a) කාලය, විදුලිය (ලකුණු 01)
b) පිළිතුර අනුව (ලකුණු 03)

6.1 ඩිම්බ පරිනත වීමට , පරිනත ඩිම්බ මුදා හැරීම, ස්ත්‍රී ප්‍රජනක හෝර්මෝන නිෂ්පාදනය (ලකුණු 03)

6.2 හෝර්මෝන අසමතුලිතතාවය නිසා , ඩිම්බ මෙරීම සිදු නොවන නිසා, (ලකුණු 03)

6.3 සමාජ රෝග වැළදී ඇත්දැයි පරීක්ෂා කිරීමට,
රුධිර ග්ලූකෝස් මට්ටමපරීක්ෂා කිරීමට,
Rh සාධකය.
රුධිර හිමොග්ලොබින් මට්ටම පරීක්ෂා කිරීමට.
(ලකුණු 04)

7.1 මූත්‍රා පරීක්ෂණය, රුධිර පීඩනය මැනීම, බර මැනීම
(ලකුණු 03)

7.2 ගැටලු විසඳීමෙ හැකියාව,තර්කානුකූල චින්තනය,නිර්මාණශීලීබව, නිරවුල් අදහස් ප්‍රකාශ කිරීමෙ හැකියාව,නායකත්වය දැරීමට ඇති හැකියාව,අවස්ථාවෝචිතව හැසිරීමෙ හැකියාව (ලකුණු 03)

7.3 ප්‍රෝටීන් - කලලයේ වර්ධනයට,මවගේ පටක වර්ධනයට,
කැලරි,
කැල්සියම් - මවගේ දත්,අස්ථි වල නීරෝගීභාවයට, කලලයේ අස්ථි වර්ධනයට ,
යකඩ - මවගේ රුධිර පරිමාව වැඩි වීමට ,
අයඩින් - ඉහත කරුණු සියල්ලටම
(ලකුණු 04)

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ] All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | ගෘහ ආර්ථික විද්‍යාව II පත්‍රය<br>மனைப்பொருளியல் வினாத்தாள்-II<br>Home Economics Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |
|---|---|---|

**පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1 පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර , දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

අවුරුදු 16 ක් වයසැති තුෂාරි තම දෙමාපියන් සමග ජීවත් වන්නීය. විදේශගතව සිටි ඇයගේ මිතුරියක නිවාඩුව ගත කිරීම පිණිස තුෂාරිගේ නිවසට පැමිණ සිටින්නීය.ගෘහ ආර්ථික විද්‍යා විෂයය ඉගෙනීමට ඉතා කැමැත්තක් දක්වන තුෂාරි විෂයයට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් නිවසේ දී අත්හදා බලමින් සිටින අතරම තම මිතුරියට ගෙන යාම සඳහා දේශීය රස කැවිලි වර්ග කිහිපයක් ද සාදා නිම කළාය. ඊට අමතරව අලංකාර බිත්ති සැරසිල්ලක්ද, අත් පිස්නා රදවනයක් ද සාදා තෑගි කළාය.

I. මිතුරියට පිළිගැන්වීමට අඹ ගෙඩියක් කැපූ තුෂාරිට එය ආහාරයට නුසුදුසු බව දක්නට ලැබුණි.එසේ පෙන්නුම් කරන භෞතික ලක්ෂණ දෙකක් නම් කරන්න.
II. තුෂාරි දිවා ආහාරය පිළිගැන්වූයේ පෙරදිග විධිමත් ක්‍රමයටය. එම ක්‍රමය රූප සටහනකින් ඇඳ දක්වන්න.
III. මිතුරියට රැගෙන යාම සඳහා ගැඹුරු තෙලේ බැදීමෙන් පිසූ දේශීය රස කැවිලි වර්ග හතරක් සාදා නිම කළාය. එම ආහාර වර්ග මොනවාදැයි නම් කරන්න.
IV. අත් ගැසීම මගින් පිටි මෝලියක ඇතිවන ඇදෙන සුළු බවට හේතු වන ප්‍රෝටීනය කුමක්දැයි නම් කරන්න.
V. යෙහෙළියට තෑගි දුන් අත්පිස්නා රදවනයෙහි වටේ දාරය නිම කිරීම සඳහා යොදා ගත් නිවැරදි මැහුම් ක්‍රම දෙක නම් කරන්න.
VI. අත්පිස්නාව මැසීමට කපු රෙදි භාවිත කළ අතර එයට හේතු දෙකක් සඳහන් කරන්න.
VII. දිවා ආහාරයට වාඩි වූ යෙහෙළියගේ මුඛයෙහි ඛේටය ශ්‍රාවය වීම නොදැනුවත්වම වැඩි විය.ඛේටය ශ්‍රාවය වීමට ඉවහල් වන ග්‍රන්ථීන් දෙකක් නම් කරන්න.
VIII. තුෂාරිගේ ආවේගශීලීබව ඇගේ දෙමාපියන්ට ගැටළුවක්ව පවතින බැවින් ඒ පිළිබඳ ඇයගේ දෙමාපියන් විසින් ගතයුතු පියවර දෙකක් යෝජනා කරන්න.
IX. බිත්ති සැරසිල්ල සඳහා යොදා ගත් උණුසුම් සහ සිසිල් වර්ණ දෙක බැගින් නම් කරන්න.
X. තම නිවස තුළට ස්වාභාවික ආලෝකය ලබා ගැනීම සඳහා තුෂාරිට යොදා ගත හැකි අනුයෝගී ක්‍රම හතරක් නම් කරන්න.

2

I. කෑම කාමරය සඳහා මැහුම් ක්‍රම උපයෝගී කර ගැනීමෙන් නිර්මාණය කර ගත හැකි ක්‍රියානුරූපී උපාංග තුනක් නම් කරන්න.
II. a)අක්සැරසිලි දෙකක් නම්කරන්න
b)ඉන් එක් ක්‍රමයක් භාවිත කරමින් නිම කළ කුෂන් කවරයක් ඇඳ දක්වන්න.
III. a) ළදරු ඇඳුමක කර, අත්කට,සහ වාටිය අලංකාර කර ගැනීම සඳහා යොදා ගත හැකි මැහුම් ක්‍රම හතරක් නම් කරන්න. b) ඉන් එක් මැහුම් ක්‍රමයක් මසන ආකාරය ඇඳ දක්වන්න.

3

I. සම්පූර්ණ ප්‍රෝටීන් වල අඩංගු වන අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල තුනක් නම් කරන්න.
II. a) ප්‍රති ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරන ජලද්‍රාවී විටමින් වර්ගයක් නම් කරන්න.
b) එම විටමිනය බහුල වශයෙන් අඩංගු වන ආහාර වර්ග හතරක් නම් කරන්න.
III. සිරුරේ නීරෝගී පැවැත්මට අත්‍යවශ්‍ය වන ජලයෙන් අපට ලැබෙන ප්‍රයෝජන හතරක් කෙටියෙන් දක්වන්න.

4

I. ආහාර වේල් සැළසුම් කිරීමේ දී පෝෂණ වගුව භාවිත කිරීමෙන් සැලසෙන ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
II. a) මාළු තෙල්වල අඩංගු වන අත්‍යවශ්‍ය මේද අම්ලයක් නම් කරන්න.
b) මෙම මේද අම්ලය භාවිතයෙන් සැලසෙන ප්‍රයෝජන දෙකක් අක්වන්න.
III. පහත දැක්වෙන දෑ හඳුන්වන්න.
- විසරණය
- බාහිර ආසෘතිය

5

I. නිවසකට ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය මැනවින් ලබා දීම හේතු කොට,සැලසෙන වාසි තුනක් නම් කරන්න.
II. සීමිත ඉඩකඩක් ඇති නිවසකට,ඉඩකඩ පිරිමසා ගැනීම සඳහා ගත හැකි පියවර තුනක් උදාහරණ මගින් දක්වන්න.
III. a) භෞතික නොවන සම්පත් නම් කරන්න.
b) එම සම්පත් අරපිරිමැස්මෙන් ප්‍රයෝජනට ගන්නා ආකාර තුන බැගින් පැහැදිලි කරන්න.

6

I. ස්ත්‍රී ප්‍රජනන පද්ධතියට අයත් ඩිම්බ කෝෂ මගින් සිදුවන කාර්යයන් දෙකක් නම් කරන්න.
II. ගර්භනී අවධයේ දී ආර්ථවය නැවතීමට බලපාන හේතු දෙකක් දක්වන්න.
III. මාතෘ සායන වලදී කරනු ලබන රුධිර පරීක්ෂණ වල වැදගත්කම පිළිබඳ කරුණු දෙකක් පැහැදිලි කරන්න.

7

I. මාතෘ සායනයකදී නිතිපතා සිදු කරන පරීක්ෂණ තුනක් නම් කරන්න.
II. යොවුන් අවධියේ දී යෞවනයාගේ මානසික වර්ධනය බාහිරව පෙන්නුම් කරන ලක්ෂණ තුනක් දක්වන්න.
III. ගර්භනී අවධියේදී ලබා දිය යුතු විශේෂ පෝෂක හතරක් නම් කර , ඊට හේතු එක බැගින් දක්වන්න.